# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1656/37 - 2010 ජුනි 03 වැනි බ්‍රහස්පතින්දා - 2010.06.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1973 අංක 25 දරන ක්‍රීඩා පනත

32 සහ 33 වගන්ති යටතේ නියෝග

ක්‍රීඩා අමාත්‍ය රත්නායක මුදියන්සේලාගේ චන්ද්‍රසිරි බණ්ඩාර රත්නායක වන මම, 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 32 සහ 33 වන වගන්ති යටතේ මා වෙත පවරා ඇති බලතල ප්‍රකාර, ක්‍රිකට් ක්‍රීඩාව සඳහා ජාතික සංගමය වන කලින් ක්‍රිකට් පාලක මණ්ඩලය වශයෙන් හැඳින් වූ ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ කටයුතු නිළවරණයක් පවත්වන තෙක් හෝ නැවත දැනුම් දෙනතුරු පවත්වාගෙන යාම සඳහා තාවකාලික වැඩ පිළිවෙලක් වශයෙන්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1595/8 හා 2009.03.30 දිනැති අති විශෙෂ ගැසට් පත්‍රය මගින් පත්කළ තැනැත්තන්ගේ නාම ලේඛනය 2010.06.01 දින සිට පහත පරිදි සංශෝධනය කළ බැව් මෙයින් දන්වා සිටිමි :

| | | |
|---|---|---|
| ඩී. එස්. ද සිල්වා මහතා | - | සභාපති |
| නිශාන්ත රණතුංග මහතා | - | ලේකම් |
| සුජීව රාජපක්ෂ මහතා | - | භාණ්ඩාගාරික |
| කාලිංග එන්. ඉන්දතිස්ස මහතා | - | සාමාජික |
| ප්‍රභාත් ෆොන්සේකා මහතා | - | සාමාජික |
| අසංග චන්දන සෙනෙවිරත්න මහතා | - | සාමාජික |

රත්නායක මුදියන්සේලාගේ චන්ද්‍රසිරි බණ්ඩාර රත්නායක,
ක්‍රීඩා අමාත්‍ය.

2010 ක් වූ ජුනි මස 01 වැනි දින,
කොළඹ දී ය.

06-377

## 1973 අංක 25 දරන ක්‍රීඩා පනත

32 සහ 33 වගන්ති යටතේ නියෝග

ක්‍රීඩා අමාත්‍ය රත්නායක මුදියන්සේලාගේ චන්ද්‍රසිරි බණ්ඩාර රත්නායක වන මම, 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 32 (ඇ) සහ 33 වන වගන්ති යටතේ මා වෙත පවරා ඇති බලතල ප්‍රකාර, රග්බි පාපන්දු ක්‍රීඩාව සඳහා ජාතික සංගමය වන ශ්‍රී ලංකා රග්බි පාපන්දු සංගමයේ කටයුතු තවදුරටත් කරගෙන යාම සඳහා, 2009.08.21 වැනි දින අංක 1615/35 දරන ගැසට් පත්‍රය ප්‍රකාරව පත්කරන ලද තැනැත්තන්ගේ පත්වීම් 2010.05.21 දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කරමි.

රත්නායක මුදියන්සේලාගේ චන්ද්‍රසිරි බණ්ඩාර රත්නායක,
ක්‍රීඩා අමාත්‍ය.

2010 ක් වූ මැයි මස 26 වැනි දින,
කොළඹ දී ය.

06-378

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.